**අතීත කතා ඇසුරෙන් නාට්‍යයට පිවිසීමේ දී , ඓතිහාසික කතා, දස මහ යෝධයින්ගේ කතා, වීර කතා, රජ කතා, දේව කතා, ආගම් කතා පිළිබඳ අවබෝධය ලැබීම.**

❖ ඓතිහාසික කතා (සයිමන් නවගත්තේගම ගේ සුභ සහ යස)

දොවාරිකස්ස දත්තස්ස පුත්තො දොමාරිකො සයං -
රඤ්ඤා සදිස රූපෙන අහොසි සුභ නාමන -
සුභං බලත්ථං තං රාජා රාජභූසා භූසිය -
නිසීදා පිය පල්ලංකෙ හාසත්ථං යස ලාලකො -

මහාවංසයෙහි දැක්වෙන පරිදි මෙය හුදු සිනාව පිණිස, කෙළි කවට කම් පිණිස කරන ලද්දෙකි.







"ලෝක පාලනය කරන දෙවියනි ඔබගේ රජතුමා මේ චන්දිභට්ටයින්ගෙන් ආරක්ෂා -
.කර වදාරනු මැනවි
දූවපියවි යන්න මං හිතන්නේ හෙළ රාජ පරම්පරාවක් ම පිරිහිලා ගියේ මේ -
නිදිමතේ .රජ කෙනෙක් වුණා ම හොඳ නින්දක් අවශ්‍යයි -චන්දිභට්ටයෝ හින්ද
පුළුවන් ද රටක් පාලනයකරන්න".

මෙම නාට්‍යයේ සුභ ගැන දන්නේ දොරටුපාලකයකු ලෙසයි. එහෙත් දොරටුපාලක කියන එක එකල වැදගත් තනතුරක්. ඉංග්‍රීසි පාලනය තිබූ කාලයේ මෙරට ගේට් මුඩලියර් කියා තනතුරක් තිබුණා. මෙරට බොහෝ වැදගත් යැයි කියන අය එකල මේ තනතුර දරලා තියෙනවා. ගේට් මුඩලියර්ලාට විශේෂ රාජකාරියක් පැවරී තිබුණේ නැහැ. මා හිතන්නේ දොරටුපාලක තනතුර ගේට්මුඩලියර්ට වඩා උසස් කියා. දොරටුපාලක මාළිගාවේ සම්පූර්ණ ආරක්ෂාව ගැන වග කියන්න ඇති. ඒ කොහොම වුනත් සුභ යසලාලක තිස්ස රජුගේ රාජ සභාවේ දොරටුපාලක ධුරය දැරුවා.

යසලාලක තිස්ස නමින් ම පැවැසෙන පරිදි, හුදු කෙළි කවට කම්හි යෙදුණා විනා සත් අවුරුදු අට මසක් රජ කම් කොට සසුනට හෝ රටට හෝ ඔහු වැඩක් කළ බව නො පෙනේ. එ බන්දකු මරා දැමීම එතරම් රටට ද නො දැනෙන්නට ඇතැයි සිතිය හැකි ය.
අයථා ක්‍රමයෙන් රජ වූ නමුදු සුභ නම් බොහෝ පින්කම් කළ බවට මහාවංසයෙහි කියැවේ. එ බඳු බොහෝ රජුන් මෙන් සංඝයා ගේ හිතවත් බව රැක ගැන්මේ වටනාකම

ඔහු මැනැවින් වටහාගෙන සිටින්නට ඇත. වසභ නැඟී නො ආයේ නම් ඔහු තව බොහෝ කලක් රජකම් කරනු ඇත.
මේ සුභ - යස පුවතෙහි දේශපාලන අර්ථය අතිමාත්‍රයෙන් ගෙන සයිමන් නවගත්තේගම 'සුබ සහ යස' නාට්‍යය නිමැවිය. ඔහුගේ අර්ථකථනය කෙසේ වතුදු මෙ පුවත හුදු කවට කමකට වඩා ගැඹුරු වූවක් බව නිසැකින් ම පෙනී යයි.
සුභ නම් තරුණයාගේ ඇවතුම් පැවතුම්වලින් ඔහු කෙරෙහි පැහැදෙන රජු ඔහු තම මාලිගයේ ද්වාරපාලක තනතුරට පත්කරනවාඑහිදී යසලාලක තිස්ස රජු හා සුබ අතර .
.ඇතිවන දෙබස සයිමන් රචනා කරන්නෙ මේ අයුරින්

සුබ මම ඔබවහන්සේ ගෙන් –වරයක් පතන්නම් දේවයන් වහන්සමට දින තුනක් !
උවමනායි දේවයිනි, ගමරට බලාගොස් මගේ බිරින්දෑ සමඟ ආපසු එන්නට.

රජු බිරින්දෑ සමඟ -?

සුබ .එසේය මහරජතුමනි -

රජු තොපට උවමනා තරම් නානා මාදිලියේ ගෑහැනු මේ පුරයේ වෙසෙති -, සුබ.

සුබ කමාවුව මැනවි මහරජතුමනි -, මා සරණ බන්ධනයට පත් බිරින්දෑ හැර වෙනත් කාන්තාවන් රුචි නොකරමි මහරජ.

රජු බිරින්දෑ හැර වෙනත් කාන්තාවන් ප්‍රි !හුඩ -ය නොකරමි? තොපගේ මහරජු නම් බිරින්දෑ හැර අන් සියලුම කාන්තාවන් ප්‍රිය කරන්නේය.

සුභ සහ යස කතාව අප කවුරුත් අසා තිබෙනවාඑහෙමත් .මෙය දේශපාලන කතාවක් . නැත්නම් රාජ්‍යපාලන කතාවක්මෙරට ඉතිහාසයේ සිදු වූ වැදගත් ම දේශපාලන . මේ පිළ .කතාවක්ිබඳ ව විවිධ ඉතිහාසඥයන් ලියා ඇත.

කෙසේ නමුදු , 70 දශකයේ මැද භාගයේ දී කොළඹ මෙන්ම ලංකාවේ 'සුබ සහ යස' එතෙක් නාට්‍ය නොපෙන්වූ අති දුෂ්කර පළාත් වල පවා ඉතා සාර්ථක ලෙස වේදිකාගතවුණාඑකල කොළඹ නවරඟහලේ අප විසින් සංවිධානය කරන ලද සුබ සහ . එදින සවස .දර්ශනයක් පැවැත්වුණා 'යස6.30 වන විට ආසන දහස ඉක්මවූ මුළු ශාලාවම ප්‍රේක්ෂකයන්ගෙන් පිරී ගොස් ප්‍රවේශ පත්‍ර අපේක්ෂාවෙන් ප්‍රධාන දොරටුව ඉදිරිපිට මහා ගාලගෝට්ටියක් ඇතිවුණාහිඳ ගන්නට ආසන නොමැතිව තම කැමැත්තෙන් විවෘත . ශාලාව දෙපස සිටගෙන නාට්‍යය නැරඹූ සියයක දෙසීයක පමණ ප්රේක්ෂක පිරිසක් ද, ප්‍රේක්ෂකාගාරය දෙපස සිටියහ.

- දසමහා යෝධයින්ගේ කතා - https://youtu.be/E--00MlzDOo

)නන්දිමිත්‍ර/ සුරනිමල/ මහාසෝණ/ ගෝඨයිම්බර/ ථෙරපුත්තාභය/ මහාභරණ/ වේළුසුමන/ ඛඤ්ජදේව/ ඵුස්සදේව/ ලභියවසභ)

ලංකාද්වීපයේ රුහුණු රට දුටුගැමුණු රජ හා දකුණු ඉන්දියානු ආක්‍රමණිකයෙකු වන රජරට එළාර රජ අතර රජරට ආධිපත්‍යය පතා, ඇතිවූ මහා සංග්‍රාමයේදී දුටුගැමුණු රජගේ හමුදාවේ සිටි ප්‍රධානීන් 10 දෙනා **දස මහා යෝධයෝ** නමින් හැඳින්වේ. දුටුගැමුණුගේ පිය රජු කාවන්තිස්සයන්ගේ රාජ්‍ය සමයෙහිදී, පුරුෂයන් රාජ සේවයට තෝරා ගනු ලැබ, යථා කලයේදී තරුණ කුමරු හට සේවය කිරීම සඳහා යොදවා ගනු ලැබ ඇත.

තම කණිටු සොහොයුරු තිස්ස හා සමග දුටුගැමුණුගේ සටන් අතරතුරදී, දස රණශූරයන් මධ්‍යස්ථ හා අපක්ෂපාතී පිළිවෙතක් අනුගමනය කර ඇත්තේ දෙබෑයන් අතර හටගැනෙන එවන් වියවුලකදී එසේ අපක්ෂපාතීව සිටින බවට කාවන්තිස්ස රජු හට දිවුරා පොරොන්දු වීම නිසාවෙනි.

රජුන් දෙදෙන (එනම් දුටුගැමුණු හා එළාර) අතර විජිතපුර හිදී වූ තීරණාත්මක සංග්‍රාමයෙහිදී, නන්දිමිත්‍ර සමග නිර්මලයා (සුරනිමල) පුරයෙහි දක්ෂිණ ද්වාරය අත්පත් කර ගැනීම සඳහා සටන් මෙහෙයවූහ. මහාසෝන (සේන), ගෝඨයිම්බර හා ථෙරපුත්තාභය පූර්වදිශා ද්වාරය අත්පත් කරගනු වස්ද, අනෙකුත් රණශූරයින් සතර දෙන උත්තර හා පැළදිග ද්වාර ගනු වස්ද සටන් වැදුනහ.

**මෙම ශූරවීර වු දස මහා යෝධයින් සම්බන්ධ කතා කිහිපයක් කෙටියෙන් ,**

## නන්දිමිත්‍ර

දස මහා යෝධයන්ගෙන් එළාර රජුගේ සේනාවෙහි සෙන්පතියෙකු වූ මිත්ත ගේ බෑණනුවන් වීම නිසා මයිළනුවන් අනුව යමින් නම් ලද, නන්දිමිත්‍ර විය යුතුයසැම තැන . දණගා බඩගා යෑම වලක්වනු වස්, කුඩා මිත්ත කුරහන්ගලකට බැඳ දමා තිබුනද, ඔහුගේ මහත් ශක්තියෙහි බල මහිමයෙන් මහ බරැති කුරහන් ගලද ඇදගෙන තැන තැන යෑමට සමත් වීම, ඔහු හට නන්දිමිත්‍ර යන නම පටබැඳීමට හේතු කාරක වීයමහාවංශ විස්තරය . දක්වන අන්දමට නන්දිමිත්‍ර ඉන් ඉක්බිතිව උත්තම තෙරුවන් නමැදූ රජෙකු හට සේවය කරනු වස් රෝහණ දේශයට ගමන් කලේය.

## සුරනිමල

කාශ්‍යප බුදුන් සමයේ සතුන් මරමින් පවුකාර ජීවිතයක් ගත කළ මොහු රහත් නමකට දනක් දී උන්වහන්සේගේ බණ අසා යහපත් ජීවිතයක් ගතකොට නොයෙකුත් කුසල් කොට දෙව්ලොව බොහෝ සැප විඳ කාවන්තිස්ස රජුගේ පුතෙකු වන දීඝාභය රාජ කුමාරයාගේ ජනපදයක උපත ලැබීය. ඇතුන් දස දෙනෙකුට බල ඇතත් කිසි වැඩක් නොකරණ කම්මැලියෙක් නිසා රාජ කුමාරයා ළඟ සේවයට පිටත් කරන ළදී. අධික වේගයෙන් ඇවිද ගිය ඔහු ඉතා කෙටි කාලයකදී එතැනට ළඟා විය. දීඝාභය කුමරු නොයෙකුත් ක්‍රම වලින් ඔහුගේ ශක්තිය පරීක්ෂා කර කාවන්තිස්ස රජු වෙත පිටත් කළේය. දොළොස් හැවිරිදි තරුණයා දුටු රජතුමා මෙතරම් ලාබාල කෙනෙකුට

යෝධයෙක් විය හැකිදැයි සිතා කඩුවක් මුවහත් කිරීමට බාර දුන්නේය. ඉතා සුළු කාලයකින් මේ කටයුත්ත නිම කරණ ලදී.

## මහාසෝණ

මොහු සත් හැවිරිදි කල විසල් තල්ගස් මුලින් උදුරා දැමීමට තරම් ශක්තිමත් වූ බවත්, දස හැවිරිදි කල මහත් බල ඇති බවත්, පසුව ඇතුන් දස දෙනෙකුගේ ශක්තිය දැරූ බවද කියැවේ.මොහුව රිටිගල ජයසේන ලෙසද, හඳුන්වනු ලබයි.දුටුගැමුණු රජුට යුද්ධය සඳහා සහය දුන් යක්ක සේනාවේ නායකයා මොහුයි. අදටත් රිටිගල ප්‍රදේශයේ උගන්වන විශුද්ධි අංගම් ශාස්ත්‍රය, සුදලිය අංගම්පොර පරම්පරාවට ලබා දී ඇත්තේ ද මහසෝණ හෙවත් රිටිගල ජයසේන විසිනි. මොහු දුටුගැමුණු-එළාර යුද්ධයේදී, විජිතපුර බලකොටුව අල්ලා ගැනිම සඳහා සිදු වූ යුද්ධයේදී, මහාසෝණ යෝධයා පවුර කඩා වෙනම විවරයක් සදා ඉන් ඇතුළුව තල් රුකක් ගෙන සටන් කළ බව සඳහන් වේ.

## ගෝඨයිම්බර

දස මහා යෝධයන් අතරින් මේ ආත්මයේම නිවන් දුටු අය දෙදෙනෙකිගෝඨඉම්බර . කාශ්‍යප බුදුන් සමයේ සඟරුවනට දන්දුන් කුසලයෙන් .යෝධයා ඉන් එක් අයෙකි ඇතුන් දස .දෙව්ලොව සම්පත් විඳ පසුව ලක්දිව බොහෝ සම්පත් ඇති පවුලක ඉපදිනි .ශරීරයෙන් කොට නිසා නම සෑදිණි .දෙනෙකුගේ බල ඇතිවද කම්මැලියෙකි කාවන්තිස්ස රජු මොහුගේ බල අසා ගෙන්වා ගත්තේයපසුව මහාජත්‍ර නම් දෙමළ . රා බීමට මෙන්ම උත්සව ශ්‍රීයෙන් ගත කිරීමට .නායකයා මරණ ලද්දේ මොහු විසිනි .කැමති අයෙකි

මහාසෝණ හෙවත් රිටිගල ජයසේන හා සටන

මෙවන් උත්සවයකදී මහාසෝණ හෙවත් රිටිගල ජයසේන මත් වී සිටි අවස්ථාවකදී ගෝඨයිම්බර යෝධයාගේ බිරිඳව වැළඳගෙන තිබේ. එයින් කිපුණු ගෝඨයිම්බර, මහාසෝණට බැණවැදී ඇති අතර එයින් තමාට ඇතිවූ ලැජ්ජාව ඉවසාගත නොහැකි වූ මහාසෝණ තමා හා ද්වන්ධ සටනකට එන ලෙස ගෝඨයිම්බරට අභියෝග කර ඇත. පසු දා තම්මැන්නා සොහොනේදී පැවැත්වෙන සටනේදී ගෝඨයිම්බර යෝධයා එල්ල කරන පා පහරින් මහාසෝණගේ හිස ගැළවී ගොස් කරඹ ගහක මුදුනේ රැඳුනු බව සඳහන් වේ. මෙම ජයග්‍රණයෙන් උදම් වූ යෝධයා සුරාවෙන් මත්ව රාජ මාලිගාවට ඇතුල් වීමට තැත් කළ අතර ගැමුණු රජුගේ නියෝගයෙන් එය වැලකිණි. මෙයින් ලජ්ජාවට හා කළකිරීමට පත් යෝධයා එදිනම ලංකාද්වීපය හැරදමා භාරත දේශය බලා පිටත්ව ගියේය.

## ථෙරපුත්තාභය

කොට කන්ද අසබඩ කිට්ටි ග්‍රාමයේ රම්පති වූ රෝහණ නමැති ගෘහපතියාට දාව උපන් ගෝඨාභය, දස වස් හෝ දොළොස් වස් වන විට, පැසුණු මිනිසුන් සතර හෝ පස් දෙනෙකුට එසවිය නොහැකි මහා පාෂාණ ඔසවා වීසි කිරීමට සමත් වී ඇත . ගෝඨාභයගේ පියාණන් වූ රෝහණ, මහාසුම්ම නමැති තෙරණුවන්ගේ අනුග්‍රාහකයාව සිට තෙරණුවන්ගේ දහම් දෙසුමකට සවන් දී සෝවාන් නම් පළමු ඵලයට පත්විලූ . රෝහණ පසු කලෙක භික්ෂුවක ලෙස පැවිදි බව ලැබ පසුව අරහත් ඵලයට පත් වීම නිසා, ගෝඨාභය ඉන්ඉක්බිතිව තෙරණුවන්ගේ පුතු ලෙස අරුත් දෙන ථෙරඅභය ලෙස -පුත්- හැඳින්වීමට ඇරඹී තිබේ.

## මහාභරණ

භරණ උපත ලැබ ඇත්තේ කෝපකන්දර ග්‍රාමයේ කුමාර නමැත්තෙකුට දාවයඅවුරුදු . දහයක හෝ දොළසකකොළුවෙකුව සිටියදී, වනයේ සාවුන් එලවාගෙන ගොස් උන් අල්වා පයින් මැඩීමට සමත් වූ බවද, පසුව දහසය විය වූ විට දිව ගොස් කුරුමුවන්, ගෝනුන් හා වල්හූරන් දඩයම් කිරීමට සමත් වූ බැවින්-, මහත් යෝධයෙකු බවට පිළිගැනුමට ලක් වූ බව කියැවේ.

## වේළුසුමන

කාශ්‍යප බුදුන් සමයේ මොහු රහතන් වහන්සේ කෙනෙකුට දන් දීමේ විපාකයෙන් දෙව් සැපත් විඳ කාවන්තිස්ස රජුගේ කාලයේ මෙරට උපන්නේය. ඔහුගේ පියාගේ මිත්‍රයන් දෙදෙනෙකුගේ නම් එකතු කොට වේළුසුමන යනුවෙන් නම් තබන ලදී.

මෙම වේළු නම් මිත්‍රයාගේ එක් මෙල්ල කළ නොහැකි යයි සැලකුණු අශ්ව පැටියෙක් මෙල්ල කිරීමෙන් ඔහුගේ බලය ප්‍රකට විය. වේළු නැමැත්තා 'මොහු රාජ්‍ය සේවයට සුදුසුය' සිතා රජු සමීපයට පිටත් කරන ලදී.

විහාර මහා දේවියගේ දොළදුක් - ගැමුණු කුමරා උපදින්නට සිටින් විට මවට දොළදුක් හතරක් පමණ උපන් බව දක්වා තිබේ. රියන් සියයක් දිග මී වදයක් සංඝයාට දී තමාද කැම ඉන් එකකි. මෙය කුමරාගේ පින් බලයෙන්ම ඉටු විය. ඉතිරි දොළදුක් (තිසා වැවෙන් පැන් නෑමට හා බීමට, එළාර රජුගේ නායක යෝධයාගේ හිස කැපූ කඩුව සෝදා ජලය බීම, එළාර රජුගේ මහනෙල් මල් පැළදීම ) සංසිඳුවීමට වේළුසුමන ක්‍රියා කළේය.

මේ සඳහා ඔහු තමා එළාර රජුට පක්ෂපාතී අයෙකු ලෙස හඟවා එළාර රජුගේ අස්ගාල රැක බලා ගැනීමේ කාර්යය බාර ගත්තේය. ඉන්පසු එහි සිටින ශක්තිමත්ම අසෙකු වන රණමද්දව නම් අසෙකු හොඳින් හික්මවා තබා ගත් ඔහු එක් දිනක තිසා වැවෙන් පැන් කළයක්, මහනෙල් මල් ආදිය සකස් කොට අශ්වයා සොරාගෙන තමා වේළුසුමන බව පවසා පළා ගියේය.

ඔහු මරා දැමීමට සොළී රජු විසින් එවන ලද යෝධයන් දෙදෙනා ඔහු විසින් මරන ලදී. පසුව ඔහුගේ ගමන නැවැත්වීමට තැත් කළ මහවැලි ගඟේ වඩමන්න නම් තොට රැකවල් සිටි දහසක් පමණ දෙමළ සෙබළුන්ද ගඟේ අනක් පස රැකවල් සිටි වඩ්ඪමාන නම් දෙමළ යෝධයා ඇතුළු දහසක් දෙනාද තනිවම සටන් කොට මරා දැමීමට ඔහු සමත් විය (මේ ස්ථාන දෙකට පිළිවෙලින් දහස්තොට හා දහස්මඩලාතොට යනුවෙන් ව්‍යවහාර විය ).

ගැමුණු කුමරු රජවන විට මොහු මැදිවියේ සිටින්නට ඇතැයි සිතිය හැක. මොහු සටන් කළේ බොහෝ විට අසු පිටය. ලක්දිව එක් සේසත් කිරීමෙන් පසු කුසල් කොට දෙව්ලොව උපන් බව දක්වා තිබේ.

## ඛඤ්ජදේව

නකුලනාග පුදේශයෙහි මාහිසදෝනික ග්‍රාමයෙහි අභය නමැත්තාගේ බාලම පුතු ලෙස උපතේදී දේව යන නම් ලැබීය. මදක් කොරගැසීම නිසා කච්චදේව යන නම පටබැඳී ඇත. විශාල කුළුහරකුන් හඹා ගොස්, උන් වලගයෙන් අල්වා, ඔහුගේ හිසට උඩින් කරකවා පොළොවට ගසා දැමීමට මෙම තරුණ කොළුවා සමත් වී ඇත.

## ඵුස්සදේව

සිට්ඨලපබ්බත විහාරය අසබඩ ගවිට නම් ග්‍රාමයේ, උප්පල නමැත්තාගේ පුතු ලෙස ඵුස්සදේව මෙලොව එළිය දැක ඇතකොළවෙකු ලෙස විහාරය වෙත ගිය ඵුස්සදේව . හට හක්ගෙඩිය, හෙණ හඬ තරම් ශබ්දයකින් ලෙස පිඹීමට හැකිවීම නිසා, උම්මාදඵුස්සදේව ලෙස නම් ලැබීයපසුව ඵුස්සදේව ., කිසිදා ඉලක්කය නොවරදන දුනුවායෙක් බවට පත් විය.

## ලභියවසභ

ථුලධර කන්ද අසල, විහාරවාපි ග්‍රාමයෙහි ගෘහපති මත්තගේ පුතු ලෙස උපන් වසභ, ලභියවසභ –(දක්ෂකම්ලෙස නම් ලැබුවේ ඔහුගේ මහත් ශරීර ශක්තිය – ලාභි වසභ ( විසිවන වියෙහි පසුවුනු වසභ .හේතුවෙනි, මිනිසුන් දොළොසකු විසින් පවා ගෙනගිය නොහැකි පස් කන්දරාවක් කිසිදු වෙහෙසක් නොදරමින්ම තනිවම ගෙනගොස් වසභ-.වැව තැනීමට දායක වී ඇත

මෙවැනි දසහමා යෝධයින් සම්බන්ධ අපූරු කතා පුවත් අප අසා ඇති අතර, අපූර්වත්වයෙන් යුත් නාට්‍යමය අවස්ථා නිරූපණය කිරීමට හැකි ගුණාංග මෙම කතාපුවත් තුළ අන්තර්ගතව ඇත.

- ❖ **වීර කතා, -** https://youtu.be/oSLTvuaxzAs

**වීරකතා යටතේ එක් උදාරණයක් ලෙස,** කැප්පෙටිපොල අධිකාරම්,

**රාජපක්ෂ වික්‍රමසේකර මුදියන්සේලාගේ බණ්ඩාරනායක මොනරවිල කැප්පෙටිපොළ** (වීර මොනරවිල කැප්පෙටිපොළ ලෙස වඩාත් ප්‍රසිද්ධ වූශ්‍රී වික්‍රම ( ඔහු .රාජසිංහ රජු සහ පසුව බ්‍රිතාන්‍ය පරිපාලනය යටතේ මහ දිසාව තනතුර දැරූවෙකි 1818 ඌව නිදහස් අරගලය මැඩපැවැත්වීමට බ්‍රිතාන්‍යයන් විසින් යවනු ලැබීමෙන් පසු බ්‍රිතාන්‍ය පිළ හැරදා අරගලකරුවන් හා එකතු වූ අතර එහි ප්‍රධාන පෙළේ නායකයෙකු බවටද පත්වියබ්‍රිතාන්‍යයන් විසින් අරගලය පරාජය කළ අතර කැප්පෙටිපොළ දිසාව . ඇතුළු අනෙක් අරගල නායකයන් රැසක් අත් අඩංගුවට ගෙන රාජද්‍රෝහී වීම සම්බන්ධයෙන් චෝදනා එල්ල කර මරණ දණ්ඩනය පනවන ලදී වර්ෂ .1818 නොවැම්බර් මස 26 වැනි දින කන්ද උඩරට බෝගම්බර දී රාජද්‍රෝහියකු වශයෙන් හංවඩු ගසන ලද කැප්පෙටිපොළ රාජපක්ෂ වික්‍රමසේකර බණ්ඩාරනායක නොහොත් කැප්පෙටිපොළ මහ නිලමේ ජාතිය වෙනුවෙන් දිවි පිදූහමොනරවිල කැප්පෙටිපොළ . දිසාව සිය මරණ දඬුවම ක්‍රියාත්මක අවස්ථාවේ පෑ අසාමාන්‍ය ධෛර්යය නිසා වඩාත් කැප්පෙටිපොල .ප්‍රසිද්ධ වී ඇති අතර එතුමා ශ්‍රී ලංකාවේ ජාතික වීරයෙකු ලෙස සැලකේ නමින් ශ්‍රී ලංකාවේ ප්‍රථම මධ්‍ය විද්‍යාලය වන අකුරම්බොඩ මධ්‍ය විද්‍යාලය වීර කැප්පෙටිපොල මධ්‍ය විද්‍යාලය නමින් නම්කර ඇති අතර එය කැප්පෙටිපොල උපන් ගම් ප්‍රදේශය වන මාතලේ දිස්ත්‍රික්කයේ පල්ලේපොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මොනරවිල ග්‍රාමයට ආසන්නයේ පිහිටා ඇත.

## ❖ <u>රජ කතා,</u>




අප රටේ රාජ්‍ය පාලනය සම්බන්ධ පරමාදර්ශී රජවරු කිහිප දෙනෙක් වෙති. ඔවුන් අතරිනුදු ප්‍රමුඛ තලයට පත්වන උදාරතර රාජ චරිත දෙකක් තිබේ. අප රට එක් සේසත් කිරීම සහ බුදු සසුන නඟා සිටුවීම සම්බන්ධ ශ්‍රී ලාංකේය පරමාදර්ශය **දුටුගැමුණු** රජතුමා ය. එමෙන්ම කෘෂිකාර්මික විප්ලවයක් තුළින් අප රට සහලින් ස්වයංපෝෂිත කිරීම සම්බන්ධයෙන් පළමු වන **පරාක්‍රමබාහු** රජු පරමාදර්ශී රාජ චරිතය වශයෙන් පිළිගනු ලැබේ. **ඉතා හාස්‍යජනක කතා පුවත් මැවූ** ජනප්‍රියතම රාජ චරිතයක් තිබේ. ඒ **කැකිල්ලේ** රජතුමාගේ සුවිශේෂ චරිතාපදානයයි. රාජ්‍ය පාලනය සඳහා අවශ්‍ය විචක්ෂණශීලීත්වයක් නොමැති බැවින් අන්‍යයන් ගේ බස් අසා හෝ අත්තනෝමතික ලෙස කටයුතු කිරීම නිසා හාස්‍යෝත්පාදක තීරණ ගන්නා ඔහු ගේ අමනෝඥ ක්‍රියා කලාපයන් නිසා අතිශය ජනප්‍රියත්වයට පත් පිරුළක් තිබේ. එනම් 'කැකිල්ලේ රජ්ජුරුවන්ගේ නඩු තීන්දු වගේ' යන්න ය.

## ❖ දේව කතා,



**දෙවියෝ** යනු ශුද්ධවූ, දිව්‍යමය හෝ පූජනීය අධිතාත්වික පැවැත්මකි. දෙවියන් පිළිබඳ සංකල්පය විවිධ සංස්කෘතීන් අනුව නිර්වචනය කරඇති ආකාරය විවිධයඇතැම් සංස්කෘතීන් . ඒකදේවාදයක් අදහන අතර එකම සර්වබලධාරී දෙවියකු විසින් සියල්ල පාලනය කරන බවත් තවත් සංස්කෘතීන් තුල .විශ්වාස කරති බහුදේවවාදයක් විශ්වාස කරන අතර දෙවිවරු කිහිප තවත් සංස්කෘතීන්තුල ස්වශාව ධර්මයේ .කරති ඇතැම් ප්‍රපංචයන්ට දේවාත්වය අරෝපණය කර තවත් සංස්කෘතීන්තුල .ඇතිබව දක්නට ලැබේ

මිහිතලය මත ජීවත්වූ එක්තරා මනුෂයන් මියගියපසු දේවත්වය ආරෝපණය කරනු තවද ජීවමාන මනුෂ්‍යයන්ට හෝ සතුන්ට දේවත්වය ආරෝපණය කරඇති .ලබයි .අවස්තාද ඇතමේ පළවන්නේ භාරත දේව සභාවට අයත් දෙවිවරුන් පිළිබඳ කතා පෙළකි .බ්‍රහ්ම, විෂ්ණු සහ ශිව යන දෙවිවරුන්ට ලැබෙන ගෞරව බුහුමානය පුදුමාකාරයපෘථිවි භූමිය පුරා ඔවුන් වෙනුවෙන් දේවාල ඉදිවී තිබෙන අතර ., බැතිමත්තු පූජා වට්ටි දෝතින් රැගෙන ඒ දේවාලවල පුද පූජා පවත්වති.

මෙවැනි වූ විවිධ දේව කතා පිළිබඳව තොරතුරු දැන සිටීම ඉතා වැදගත් වේ.

❖ **ආගම් කතාද**

ශ්‍රී ලංකාවේ නාට්‍ය සඳහා ජාතක කතා සාර්ථක ව යොදාගෙන ඇති අවස්ථා පිළිබඳ ව කතා කළහොත් ඒ සඳහා දිය හැකි හොදම උදාරණ ලෙස

- කදාවළලු (සේරිවාණිජජාතකය),
- පබාවතී (කුස ජාතකය),
- මනමේ (චුල්ල ධනුද්ධර ජාතකය),
- ලෝමහංස (ලෝමහංස ජාතකය),
- වෙස්සන්තර (වෙස්සන්තරජාතකය),
- සඳකිඳුරු (සඳකිඳුරු ජාතකය)
  ආදි ජාතක කතා මෙන් ම බෞද්ධ සාහිත්‍යයේ සඳහන් වන කුණ්ඩලකේශී, ස්වර්ණතිලකා ආදි කතා නාට්‍ය සඳහා සාර්ථක ව යොදාගෙන ඇත

එමෙන් ම අන්‍යාගමික කතා වස්තු ද නාට්‍ය සඳහා යොදාගෙන ඇති ආකාරය දෙස බැලු කළ

- සාන්තුවර සෙබළාණෝ ''නාට්‍යය
- පාස්කු නාට්‍ය,
- හින්දු ආගමික නාට්‍ය
  ආදිය ජනජීවිත හා බැඳී ඇත.

මේ ආකාරයට ආගම් ආශ්‍රයෙන් නිර්මාණය වූ නාට්‍ය ලාංකික කලාකරුවන් අතින් නිර්මාණය වී ඇත.

ඉග්නේෂස් ලොයෙලා මුනිවරයාගේ කතාව තේමා කොටගෙන සුගතපාල ද සිල්වා අතින් නිෂ්පාදනය වූ ' සාන්තුවර සෙබළාණෝ' බෙහෙවින් ජනප්‍රිය නාට්‍යයක් බව පෙන්වා දිය හැකිය.

මේ ආකාරයට බලන කළ ශ්‍රී ලාංකේය සංස්කෘතියේ ඓතිහාසික පසුබිම හා සංස්කෘතික හා සාමාජික වටිනාකමක් සහිත තේමා රැගත් නාට්‍යමය අවස්ථාවන්ගෙන් නිර්මාණය වූ වේදිකා නාට්‍ය අපට දැක ගැනීමට හැකිය . එමගින් ,

- ඓතිහාසික කතා හා සිද්ධීන් / චරිත හඳුනා ගැනීමේ හැකිවීම
- වර්තමාන සමාජයට අවශ්‍ය ආදර්ශයන් එමගින් සැපයෙන බව දැනගැනීම
- සමාජයෙන් ගිලිහී යන යහපත් සංස්කෘතිකාංග අගය කිරීමට මෙමගින් හැකියාව ඇත.